රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 23/96

මගේ අංකය :- III/945/එල්ටීසී/1990/4
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

1996.07.26

සියළුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**දිවයින ඇතුලත රාජකාරී ගමන්- ආයතන සංග්‍රහයේ**
**XIV පරිච්ඡේදයට සංශෝධනය කිරීම.**

ආයතන සංග්‍රහයේ XIV_පරිච්ඡේදයේ 4 වගන්තිය , 4:1:1 වශයෙන් උප වගන්තියක් එකතු කිරීමෙන් සංශෝධනය කෙරේ.

4:1:1 රාජ්‍ය නිලධරයන් සඳහා සංවිධානය කෙරන පුහුණු පාඨමාලාවල යෙදීමේදී ඔවුන් නේවාසිකව රැඳී සිටීම අපේක්ෂා කරන්නේ නම්ද, සාමාන්‍ය රාජකාරී කාල වේලවෙන් පරිබාහිරව එම පාඨමාලාව සඳහා සහභාගී වන්නේ නම්ද, පහත සඳහන් අවශ්‍යතා සපුරන්නේ නම් පමණක් පුහුණු ආයතනය විසින් දිරිගැන්වීමක් වශයෙන් ලබා දෙන මූල්‍යමය ප්‍රතිලාභ වලට අමතරව එම පරිච්ඡේදයේ 4:4 හා 4:5 වගන්ති අනුව සංයුක්ත දීමනාද, 1 වගන්තිය අනුව ගමන් වියදම් දීමනාද ලබා ගත හැකිය.

(අ) සංයුක්ත දීමනාව ගෙවනු ලබන පුහුණු කාලසීමාවේ උපරිමය සති 02 ක් විය යුතුය.

(ආ) පදිංචි ස්ථානය හා පුහුණු ආයතනය අතර දුර ප්‍රමාණය සැතපුම් හතකට (07) වැඩිවිය යුතුය.

(ඇ) ගමන් වියදම් ගෙවිය යුත්තේ යාම් ඊම් වෙනුවෙන් එක් ගමනක් සඳහා පමණකි.

අ.කලේ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත
හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.